# වසර 7කට පසු ශ්‍රී ලංකා ආරක්ෂක අංශවලට ඉන්දියාවේ චාරිකාවක්



මහ කොමසාරිස් මිලින්ද මොරගොඩ මහතා සමග මහ කොමසාරිස් කාර්යාලයේ දී සමූහ ඡායාරූපයකට පෙනී සිටි අවස්ථාව.

ඉන්දු ශ්‍රී ලංකා ආරක්ෂක සහයෝගිතාව ශක්තිමත් කරන පියවරක් වශයෙන් සති දෙකක අධ්‍යයන චාරිකාවක් සඳහා ඉන්දියාවට පිටත්ව ගිය ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ නිලධාරි කණ්ඩායමේ නියෝජිත පිරිසක් මහ කොමසාරිස් මිලින්ද මොරගොඩ මහතා නවදිල්ලියේ දී මුණ ගැසුණි.

තිස්හය දෙනකුගෙන් යුතු මෙම නිලධාරි කණ්ඩායම මේජර් ජනරාල් ලසිත් හේරත් මහතාගේ නායකත්වයෙන් යුතු අතර, ඔවුහු යුද, ගුවන් හා නාවික යන ත්‍රිවිධ හමුදා නියෝජනය කරති.

ඉන්දියාවෙහි ගත කරන කාලය තුළ නවදිල්ලිය, මුම්බායි හා පූනේ නගරවල පිහිටි ඉන්දීය ආරක්ෂක අංශ සමග අධ්‍යයන කටයුතුවල නිරතවීමට නියමිතය.

වසර හතකට පසු මෙම අවස්ථාව ලැබීම විශේෂ සිද්ධියකි.